036

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපනඥයින් සඳහා වන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2008

**ESP 2468 - ප්‍රාථමික තලය සඳහා සිංහල භාෂාව**

**කාලය - පැය තුනයි.**

---

දිනය - 2008.05.30 වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30 දක්වා

---

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) නිර්මාණාත්මක සාහිත්‍ය යනු කුමක් දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ළමා සාහිත්‍යයේ දක්නට ලැබෙන ලක්ෂණ පහක් ඉදිරිපත් කොට ඒවායේ යෝග්‍යතාවය විමසීමට ලක් කරන්න. (ලකුණු 14)

(iii) ප්‍රාථමික පාසල් සිසුන්ගේ ආවේදනික ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ළමා සාහිත්‍ය ඇසුරෙන් යොදාගත හැකි ක්‍රියාකාරකම් පැහැදිලි කරන්න. (ලකුණු 14)

02. (i) ඔබ විසින් නරඹන ලද ළමා චිත්‍රපටියක් ඇසුරු කොටගෙන සිංහල සිනමාවේ ළමා චිත්‍රපටිවල අනාගතය පිළිබඳව පුවත්පතකට විවේචනාත්මක ලිපියක් ලියන්න. (ලකුණු 17)

(ii) ශ්‍රී ලංකාවේ ළමා චිත්‍රපට ප්‍රවර්ධනය පිණිස ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 16)

03. (i) භාෂා වර්ධනය සම්බන්ධ දාර්ශනික හා මනෝ විද්වතුන්ගේ අදහස් සනිදර්ශනව විමසීමට ලක් කරන්න. (ලකුණු 17)

(ii) එකී අදහස් කෙතෙක්දුරට වත්මන් ප්‍රාථමික පංතිකාමරය තුළ උපයෝගී කොට ගෙන ඇත්දැ'යි පරීක්ෂා කරන්න. (ලකුණු 16)

UNIVERSITY OF SRI LANKA LIBRARY

04. "කියවීම ප්‍රියජනක භාෂා කාර්යයක් වුවද වත්මන් සමාජය එම කාර්යයෙන් ඈත්වන සෙයක් පෙනේ."

ඉහත කියමන අනුව ප්‍රාථමික ළමුන්තුළ කියවීම ප්‍රියජනක ක්‍රියාවක් බවට පත් කිරීමට ඔබ යෝජනා කරන ක්‍රමෝපායයන් විස්තර කරන්න.

(ලකුණු 33)

05. (i) දෙවන ශ්‍රේණියේ සිසුන්ගේ වින්දනාත්මක සවන්දීම දියුණු කිරීම සඳහා උචිත ක්‍රියාකාරකම් හතරක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

(ii) එම ක්‍රියාකාරකම් භාවිතා කිරීමේදී ඔබට මතුවිය හැකි ගැටලු හා ඒවා මඟහරවා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 23)

06. පහත සඳහන් ඕනෑම තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) අධ්‍යාපනික ක්‍රියාකාරකමක් ලෙස නාට්‍යය යොදා ගැනීම.
(ii) කාව්‍යයක් විචාරය කිරීමේදී විචාරකයා සැලකිය යුතු කරුණු
(iii) අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හා ඒවා අත්පත් කරදීමේදී ගුරුවරයාගේ කාර්යභාරය
(iv) ප්‍රාථමික ගුරුවරයකුගේ ගුරු නිපුණතා තක්සේරු කිරීම සඳහා උචිත නිර්ණායක ඇතුළත් තක්සේරු පත්‍රිකාවක ස්වරූපය

(එක් කොටසකට ලකුණු 11 බැගින්)

- හිමිකම් ඇවිරිණි. -